ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 118/ News/ 2011

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2011 දෙසැම්බර් 19 සඳුදා
04 වෙළුම - 09 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

## විශේෂ නත්තල් කලබ

ළමා ප්‍රදීපය කියවන පුංචි ඔබ සැමට

## සුබ නත්තලක් වේවා!



පිටකවර සිත්තම: එම්. දිලිනි ඉෂාරා පෙරේරා

## ගවහලක ඉපදුන ජේසු බිළිඳු

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# නත්තල වර්ගීකරණය කරන්න එපා

## ආදරණීය දුවේ පුතේ...

2011 නත්තලත් අත ළඟටම ඇවිල්ලා. මුළු පරිසරයම අමුතු හැඟීමක් ගන්න විට අපට දැනෙනවා නත්තලේ මිහිරියාව. බටහිර ලෝකය තුළ නම් මේ කාලවකවානුවේ පරිසරය තුළ වෙනස්වීම් හරි හරියට සිදු වෙනවා. කොළ හැළුණු ගස් වල ඉපනැලි අතරින් සුදුවන් හිම ගලා හැලෙන කොට එයින් ජනිත කරවන පින්තූරය හරිම ප්‍රියංකරයි. හිම පතිත වන්නෙත් මේ නත්තල් සමය තුළයි. සීතල සුළඟ අවට හමන විට ඒ සීතල ගත දැවටෙන කොට නත්තලේ මිහිරියාව අපට අලුත්ම ආරක කථා පුවතක් පවසන බව තේරුම් ගන්නට ඕනා.

පරිසරය තුළ එවැනි වෙනස් කම් අපි දකින්නේ මේ නත්තල් සමය තුළයි. අප දේශය තුළත් මේ වෙනස්කම් දැකිය හැකියි. පුංචි ඔබ තමයි මේ විශේෂ වෙනස සම්පූර්ණයෙන්ම දකින්නේ. පැත්තකින් පාසැල් නිවාඩු කාලය පටන් අරගෙන. අළුත් ඇඳුම්, අළුත් පොත්පත් ලැබෙන වකවානුවක්. නෑදෑ පිරිස් එකතු වන්නට කථා කරන කාල වකවානුවක්.

ආදර දුවේ පුතේ පරිසරය තුළ බාහිරින් ඇතිවන මේ වෙනස අභ්‍යන්තරය තුළත් අපට වෙනසක් ඇති කර ගන්න කියලා පවසනවා. ඒ වෙනස නත්තලේ පනිවුඩයත් සමඟම අපි තේරුම් ගන්නට ඕනා. නත්තලේ සැබෑ අර්ථය අප ගැලවුම්කාරයාණන් මිනිස් බව ගෙන මේ ලෝකයට වැඩම කිරීමයි. එලෙස මිනිස් බව අරගෙන මේ ලෝකයට පැමිණි අප ගැලවුම් කරුවාණන් වන ජේසුන් වහන්සේ සියළු සුසිත් ජනයා හට අලුත් තාලේ සාමයේ පණිවුඩයක් ගැන කථා කළා. මනුෂ්‍යත්වයේ අලුත්ම පැතිකඩක් ගැන පෙන්නුම් කලා. එකමුතු බව, ලෙන්ගතු බව, දැහැමියාව පිළිබඳව ලස්සන කථා වලියක් ගෙන හැර දැක්වුවා.

ආදර දුවේ පුතේ, ඒ පණිවුඩය සමඟ මුළු මහත් ලෝකයට මොකද වුනේ ? ලෝකය වෙනස් වුණා. ඉතිහාසය අලුතෙන් ලියවෙන්නට පටන් ගත්තා. ක්‍රිස්තු වර්ෂය ආරම්භ වුණා. කිතුනු පණිවුඩයේ ඉස්මතු කරවන අසල්වැසි දයාව පිළිබඳව ජනතාව කථා කරන්නට පටන් ගත්තා. එකිනෙකා දිහා ආදරයෙන් බලන්නට පුරුදු වුණා. නත්තලේ පණිවුඩය මෙය යි. මේ පණිවුඩය ආදරයේ හා මනුෂ්‍යත්වයේ පණිවුඩයයි. මිය ගිය, මිලාන වුන මිනිස් කම නැවත අලුත් වුනේ මේ උපත නිසයි. දුරස් වුණු, ඈත් කල සහෝදරත්වය නැවත දළු ලා ලියලන්නේ මේ සාමයේ නායකයාණන්ගේ මනු උපත නිසයි.

ඉතින් දුවේ පුතේ මේ උතුම් උපතේ පණිවුඩය වෙනස් වන්නේ නැහැ. පණිවිඩය එකමයි. එහෙත් අභාග්‍යයකට අද දහම අදහන සමහර වැඩිහිටියන් නත්තල වර්ගීකරණය කරන්න උත්සාහ කරනවා. සර්ව පිත්තල නත්තල, චාම් නත්තල, වානිජ නත්තල, වෙළඳ නත්තල, පෝසත් නත්තල, දුප්පත් නත්තල, බටහිර නත්තල, අපේ නත්තල, දේශීය නත්තල කියලා, විවිධ නම් දමලා නත්තලේ හරය අවතක්සේරු හා අඩු තක්සේරු කර ගන්න හදනවා. අපිට උතුම් නත්තලේ මහා පණිවිඩය ඒ වර්ගිකරණය තුළ උස් පහත් කරන්න බැහැ. දහම අදහන්නේ නැති අන් විශ්වාසිකයන් අතරත් ජාතික උත්සවයක් හැටියට නත්තල විහිද ගොස් තිබෙන නිසා අද මුළු මහත් ලෝකයම මෙම මහා උත්සවයට එකතු වෙනවා. ඒ රාමුව තුළ බාහිර ලෝකයේ විවිධ ලබ්ධිකයින් එකතු වෙනකොට කතෝලික ඔබට තිබෙන්නේ එකම පණිවුඩයයි. කිසිම වර්ගිකරණයකට හසු නොකර නත්තල සාමයේ, සහෝදරත්වයේ එකමුතු බවේ පණිවුඩය රැගෙන ආ අප සාමයේ නායකයාණන් වු ජේසුස් වහන්සේගේ උපත සේ සැමරීමයි. පුංචි ඔබ බාහිරව මේ ජාතික උත්සවයට පරිසරය තුළ එකාත්මික වනවිට ඔබේ අධ්‍යාත්මයේ මහා පිබිදීම ධර්මයේ එකම පණිවුඩය බවට පත් කර ගන්න. විවිධ වර්ගිකරණයන් නොදෙමින් එකම අධ්‍යාත්මික පණිවුඩය මිනිස් ජීවිත වලටත්, අවට පරිසරයටත් රැගෙන යන සාමයේ පණිවුඩකරුවන් වන්න. 2011 නත්තල් පණිවුඩය වන්නේ එයයි.

**ළමා ප්‍රදීපයේ පාඨක ලේඛක**
**පුංචි ඔබ සැමට සාමයෙන් පිරි**
**ප්‍රේමයේ නත්තල් පණිවිඩය**
**ප්‍රාර්ථනා කරනවා. සුබ නත්තලක්.**

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# ඔබ සමරන්නේ අරුත්බර නත්තලක් ද ?



අපි සැවොම සෑම වර්ෂයකම කිතු සමිඳුන්ගේ උපත නත්තල් මංගල්‍යය සමරනු ලබනවා. ජේසු අපිට පැවසු විදියට එනම් උන්වහන්සේගේ දහම අනුව දුප්පත්, දිළිඳු නත්තලකට අපි මුල පුරන්න අවශ්‍යයි. පුංචි අපි මේ වසරේ නත්තල හරියාකාරව සැමරීමට උත්සාහ දරමු.

නත්තල ආරම්භයත් සම රූපවාහිනීවල දැන්වීම් ප්‍රචාර වලට නත්තල් සීයාව යොදා ගන්නවා. මහා පාරේ ගමන් කරන අපට අවට කඩමංඩි වල නත්තල් සීයාව වෙළෙඳ භාණ්ඩයක් කරගෙන තිබෙන බව ඕනෑ තරම් දක්නට පුළුවන්. අද නත්තලේ සැබෑ අරුත් අපෙන් ඈත්වෙලා සැඟවීලා ගොස්ය. වසරින් වසරට අලුත් සමාජයක් සමග මේ අරුත සැඟ වෙනවාය.

නත්තල යනු හුදෙක් විනෝදය, පාටිය බවට පත්වී ඇත. නත්තල අපි පාටියක් කරගෙන ඇත. සමහර නිවෙස්වල නත්තල් මංගල්‍යයට කතෝලික කෝඩිය හා රතු, සුදු නත්තල් ධජය යොදා ගන්නා නිවෙස් ඉතාමත් අල්පයි. ඒ නිසා පුංචි ළමා අපි මේ දේ වටහාගෙන අපේ නිවෙස් වල කතෝලික කොඩියත්, නත්තල් ධජයත් අභිමානයෙන් යුතුව ඔසවා තබන්නට වෙර දරමු. ඔව් නත්තලේ දී අපි සතුටු වෙන්නටත් අවශ්‍යයි. අපේ අසල්වැසියන් සමඟත් අපි ප්‍රීතී විය යුතුයි. හැබැයි ගෙදරට අරක්කු වැනි මත්ද්‍රව්‍ය හා වැඩකට නැති ගීත දමලා නොවෙයි. පල්ලියට යෑම, ගවලෙන නත්තල් ගස සෑදීම විතරක් නොව සෑම යහපත් දෙයකින්ම සතුටු විය යුතුයි. සමහර ළමුන් අද නත්තල් පූජාවට යාමට විශේෂ ඇඳුම් පැළඳුම් බලාපොරොත්තු වෙනවා. ඇඳුම් පැළඳුම් ඉල්ලා දෙමාපියන්ට කරදර කරනවා. දෙමාපියන් අරන් දෙන ඇඳුමට අපි සතුටු වෙමු. නැතහොත් තමාට තිබෙන හොඳ ඇඳුමක් ඇඳීමත් වඩාත් සුදුසුයි. නත්තල් සීයා ද සෑම වසරකම පාහේ මෙවරත් වෙළඳ භාණ්ඩයක් වෙලා. එයට අපි විරුද්ද වී වැලැක්විය යුතුයි. මෙය ශා. නිකලස් මුනිතුමාට කෙරෙන අගෞරවයකි. මෙදා සැරේ නත්තලට වත් නත්තල් සීයා හෙවත් සා. නිකලස් මුනිතුමාව වෙළඳ භාණ්ඩයක් කර ගැනීමට අපි ඉඩ නොදෙමු.

ඔබ සැමට සාමය පිරි ශුභ නත්තලක් වේවා !

**බී. ඒ. මනෝජ් දිවංක**
**10 ශ්‍රේණිය,**
**සා. අන්තෝනි දහම් පාසල,**
**බණ්ඩාරවෙල.**

## ජේසු උපත එදා හා අද



එදා දුගී ගව මඩුවක ජේසු උපත සිදු වුණාය
ගව බැටළු තණ කන ගව ඔරුවක සැත පුනාය
පිදුරු හා තණ කොලමත ජේසු බබා සැතපුනාය
කඩමළු රෙදි පොරවගත් ගොපලුන් එඩේරුන්
ජේසු බබා දැක දුක් වුණාය
දෙව් මව් හා ජුසේ තුමා දෙවිඳුගේ අණ පිලිගත්තාය.

අද ජේසු උපත සිහි කරනා ගව මඩුවත් බැබළුණාය
ලයිට් බුබුළු නෙක සැරසිලි දස අතට විහිදිලාය
අප සිහි කරනා ජේසු බබා මෙට්ටය මත සැතපිලාය
වෛරණ දිව සළු ඇද සිටිනා මිනිසුන් වටවෙලාය
ඈ සිහි කරනා ජේසු උපත දැක
දෙව්මව් හා ජුසේ තුමා දුක් වෙලාය.

**ඈන් විනෝලි මධුෂාණි**
**10 ශ්‍රේණිය,**
**සා. ජෝශප් දහම් පාසල,**
**පමුණුගම**

කෙටි කතාව

# සැබෑ නත්තලක්



**එවාන් ප්‍රනාන්දු**
**7 ශ්‍රේණිය, ලූර්දු මාතා දහම් පාසල, කිඹුලාපිටිය.**

"මේ වැඩේ කරන්න බෑ. ප්‍රැක්ටිස් නොකර කොහොම ද එදාට ගීතිකා කියන්නේ ? කෝ, සමන්මලී අදත් නෑ. එයාට කිවුවද මම එන්න කිවුවා කියලා ?"

විදුලි ඕගනය මතින් නැගී සිටි ගුරුතුමියගේ හඬ මුළු දේවස්ථානය පුරාම දෝංකාර දුන්නා.

"මිස් ... මම ගියා, එයාලගේ ගේ වහලා තිබුණා." නිපුන් පිළිතුරු දුන්නා.

ඉතා මිහිරි කටහඬක් ඇති සමන්මලී පල්ලියේ ගායනා කණ්ඩායමට නැතිවම බැරි සාමාජිකාවක්. ඇය ගැන වැඩි යමක් සුපුන් නොදන්නේ සුපුන්ලා මේ ගමට අළුත් නිසා. ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු වු සුපුන්ගේ පියා ගැමි සුවඳට කවදත් ආදරය කළ නිරහංකාර පුද්ගලයෙක්. එබැවින් ඔහු නගරයේ තදබදයෙන් මිදී, ගමට පැමිණියේ මීට මාස හයකට පෙර.

සමන්මලී ඇතුළු තව ළමුන් කීපදෙනෙකු නොපැමිණි බැවින්, හෙට දිනයේ එම ළමුන් රැගෙන ඒම තව ළමුන් කීපදෙනෙකුට භාර කළ ගුරුතුමිය, යාච්ඤා කර, එදින කටයුතු අවසන් කළා.

"ඒ පැත්තට යන අය ඉන්නවනම් එන්න කියන්න පුතා..." ඒ දෙසට යන සියලුම දරුවන් තම මෝටර් රථයට නංවා ගත් සුපුන්ගේ මව, ඔවුන්ගේ නිවාස අසලින් ඔවුන් බස්වා, තම නිවසට යාමට ගියාය.

"අම්මා, අම්මා... නවත්වන්න.. අර සමන්මලී !"

"කවුරු ?"

"සමන්මලී.. අපේ පන්තියේ .. ටීචර් එයාට පණිවුඩයක් කියන්න කිව්වා"

මෝටර් රියෙන් බට සුපුන් පිටු පසින් ඔහුගේ මවද පැමිණියාය. මාවත අසල වූ, ගරා වැටුණු, ඉපැරණි අම්බලමක් තුළ, එලන ලද ඉටි රෙද්දක් මත හිඳ පොතක් කියවමින් සිටි සමන්මලී, සුපුන් සහ මව දැක කලබලෙන් නැගිට සිටියාය.

"සමන්මලී ඇයි අද ආවේ නැත්තේ ? හෙට කොහොමහරි එන්න කියාල ටීචර් කිව්වා"

කිසිදු පිළිතුරක් නොදුන් සමන්මලී මඳක් ඔබ්බෙන් සිටි ඇගේ මව දෙස බැලුවා.

"මේ... අර වත්තේ අලුත් ගෙදරට ආ නෝනා වෙන්නැති2" ඉතා දුබල හඬින් අසමින් නැගී සිටි ඇගේ මව දුටු වහාම සුපුන්ට සිහියට නැගුණේ එදා, ජේසු බබා කුසේ තියාගෙන, බෙත්ලෙහෙමේ නිවසක් ගානේ යමින්, ඉඩක් ඉල්ලා සිටි මරිය අම්මාවයි.

"ආ.... මේ සමන්මලීයි අපේ පුතයි දහම් පාසලේ එක පන්තියෙනේ. මේ සමන්මලීගේ අම්මා වෙන්න ඇති... ඇයි අද දුවව යැව්වේ නැත්තේ ?"

"අද විතරක් නෙවේ නෝනා.... මම කිව්වා කෙලීට ඔය කැරොල් එකට යන්න එපා කියලා..."

"ආ...! ඒ ඇයි ?"

"හෙට අනිද්දා මමත් ඉස්පිරිතාලේ යන්න ඕනා. ඊටත් ඔය මහනවාය කියන අඳුමට දෙන්න කෝ සල්ලි ? ගෙවල් කුලී ගෙවලා නැති නිසා ගිය මාසේ අන්තිමට අපිව ඒ ගෙදරින් එලියට දැම්මා. වෙන යන්න තැනක් නැති නිසා අපි මේ කෙලීත් එක්ක මේ අම්බලමට තමයි ආවේ නෝනා..."

තමන් පොරවාගෙන සිටි චීත්තයෙන් කඳුළු පිසදා ගත් මව වගේම, සමන්මලීගේ දෑසත් කඳුලින් පිරෙනවා සුපුන් දුටුවා.

"එතකොට සමන්මලීගේ තාත්තා ?"

"එයාට මේ ගමේ කවුරුවත් වැඩක් දෙන්නේ නෑ නෝනා. හොරකම් කරනවය කියලා. ඉතිං ඔය කැලෑ සතෙක් මස්කරලා විකුණාලා කීයක් හරි හොයා ගන්නවා."

සමන් මලීගේ මවගේ අනපේක්ෂිත කතාවෙන් සුපුන් මෙන්ම මව ද ඇඩි තිගැස්මකට ලක් විය. ගහකොළට, සතා සිව්පාවාට ආදරය කිරීමට තමන්ව ද පුහුණු කළ තම මවට නම් මේ ක්‍රියාව කොහෙත්ම දැරිය නොහැකි බව සුපුන්ට එකවර වැටහුනා.

"ආ... කමක් නෑ... හවස් වෙලා තුන් දෙනෙත්

ඉතිරිය 14 පිටුවේ




ගරු නිරංජන් විජේරත්න
(සා. බෙ. නි.) පියතුමා

ආදර දුවේ පුතේ ඔබට නත්තල කියලා කියන්නේ මොකක්ද ? නත්තල නිසා ඔබේ අම්මා, තාත්තාට කරදරයක්ද ? ඔබ දකින දකින දේ නත්තල් කාලයේ ඉල්ලනවාද ? ඔබ ඔබට සංසය අත්දැකීමක් තුළින් මෙදා නත්තල වෙනස්ව හිතන්නට මගක් පෙන්වලා දෙන්නෙමි.

මම බෝගම්බර හිර ගෙදරට ගිය වෙලාවේ එක්තරා තාත්තා කෙනෙක් ඉතාමත් දුක්බර අත්දැකීමක් බෙදා ගත්තා. මේ තාත්තා ගිය අවුරුද්දෙ තමාගේ දරුවන් සමග නත්තල සමරන්න සූදානම් වුනා. නමුත් දරුවෝ දෙන්නා නත්තලට සෙල්ලම් බඩු ඉල්ලලා අඩනවා. සෙල්ලම් බඩු ගන්න සල්ලිත් නෑ. කොහොමහරි මේ තාත්තා ජෝමන්ට් එකේ තිබුණ සෙල්ලම් බඩු හොරකම් කරන්න ගිහිල්ලා පොලිසියට අහුවුණා. අද මේ තාත්තා හිරගෙදර. මේ තාත්තාට ගිය නත්තලත් නෑ. මෙදා නත්තලත් නෑ.

# වෙන්න ඔබත් ජේසු වගේ හොඳ දරුවෙක්



ඉතින් ආදර දුවේ පුතේ, නත්තලුත් ළඟ ළඟම එනවා. ඉස්කෝලේ නිවාඩු එහෙම ලැබිලා දැන් ලහි ලහියේ නත්තලට සූදානම් වෙනවා ඇති. නත්තල් ගස් හදන්න. ගවලෙන් හදන්න ලක ලෑස්තිවෙලා ඇති. මේවා ඔක්කෝම හොඳ දේවල්. මේවා තුළින් අපි ජේසුන් වහන්සේගේ මංගගතවීම සමරණු ලබනවා. හැබැයි ඒවා විතරක් කරලා අපිට සතුටු වෙන්න බෑ. ජීවිතයේ වෙනසක් ඇති කර ගන්න ඕන. හැමදාම සමරපු නත්තලට වඩා වෙනස් නත්තලක් මේදා සමරන්න ඕනා.

ඉතින් ආදර දුවේ පුතේ, එක්තරා රටක රත්තරනින් හදපු ගවලෙනක් මහජන ගෞරවයට ප්‍රදර්ශනය කළා. එක් රාත්‍රියකට හොරු කණ්ඩායමක් ඇවිත් සියල්ලම හොරකම් කරගෙන ගියා. නමුත් ජේසු බබාගේ ප්‍රතිමාව විතරක් ඉතුරු කරන ගියා. නමුත් වාසනාවකට වගේ ආරක්ෂක අංශයේ අය හොරුන්ව අල්ලගත්තා. මෙය හොරුන්ගෙන් ප්‍රශ්න කළා ගවලෙනේ ප්‍රධාන චරිතය ජේසු බබා. අපි ඒක ඉතුරු කරලා අනිත් ප්‍රතිමා පමණක් අරගෙන ගියේ. පස්සේ හොරු කියනවා. ඔබලාට ගවලෙනේ ප්‍රධාන චරිතය ජේසු බබා වෙන්න ඇති. නමුත් අපේ සැලසුම් වලට අනුව අපට වටිනාකමක් තිබුණේ අනික් ඒවා. ඔටුවා, හරකා, බූරුවා, රජතුමන්ලා, බැටළුවෝ වගේ ප්‍රමාණයෙන් වැඩි ඒවා. ඒවායේ වටිනාකම වැඩියි. කුඩා ඒවායේ වටිනාකම අඩුයි. අපි හිතනවා කුඩා ඒවා වෙලා තිබුණොත් ගන්නවා කියලා. නමුත් වෙලාවක් තිබුණේ නෑ. ඒකයි ජේසු බබාගේ ප්‍රතිමාව විතරක් ගවලෙනේ ඉතුරු වුනේ කියාල. “අනේ මෙහෙමත් හොරු උඹලාට මේ ලෝකෙත් නැහැ. ඒ ලෝකෙත් නැහැ කියලා ” ආරක්ෂක අංශය උත්තර දුන්නා.

2011 නත්තල සමරන්න සැරසෙන අපි තවමත් හොරු කණ්ඩායමකට දෙවෙනි වන්නේ නැත. අපට නත්තල කියන්නේ ගවලෙන, නත්තල් කාඩ්, නත්තල් සීයා තෑගි බෝග වගේ දේවල් අපට ජේසු බබා උන්වහන්සේ උපන් දිනය අමතක වෙනවා. අපි කවදාවත් අපේ පවුල තුළ ජීවමාන ගවලෙනක් වන්නට නත්තල් සුබ පැතුමන් වන්නට අර අදිනු දැකීම දුබලයි. අපට නත්තල් කියන්නේ බාහිර ආටෝපය පමණයි. කිසිම අධ්‍යාත්මයක් නෑ, ආදර දුවේ පුතේ මම පසුගිය ලිපියෙන් ඔබට කිව්වා ජේසු එනවා ඔබ ලෑස්ති ද කියලා. මෙන්න එහෙනම්, ඒ ජේසුව පිළිගන්නට, ඔබේ ජීවිතය ඔබේ හදවතට, ඔබේ පවුලට වැඩම කරන්නට අවස්ථාව ඇවිල්ලා තියෙනවා.

අපට නත්තල කියන්නේ ගවලෙන, නත්තල් කාඩ්, නත්තල් සීයා තෑගි බෝග වගේ දේවල් අපට ජේසු බබා උන්වහන්සේ උපන්දිනය අමතක වෙනවා. අපි කවදාවත් අපේ පවුල තුළ ජීවමාන ගවලෙනක් වන්නට නත්තල් සුබ පැතුමන් වන්නට අර අදිනු දැකීම දුබලයි. අපට නත්තල් කියන්නේ බාහිර ආටෝපය පමණයි. කිසිම අධ්‍යාත්මයක් නෑ,

කරුණාකර 15 පිටුව බලන්න

ළමා ප්‍රදීපය
2011 දෙසැම්බර් 19 වන සඳුදා
නත්තල් කලාපය 2011

# අපූරු මිතුරු පෙම



එක ගමක නිමල් සහ විනිවිද කියලා ළමයි දෙදෙනෙක් සිටියා. විනිවිදට එතරම් අගහිගයක් තිබුණේ නෑ. එයාගේ තාත්තා රජයේ ලිපිකරුවෙක්. අම්මා ගුරුවරියක්. නිමල් දුප්පත්. එයාගේ තාත්තා කොහු මෝලක දවස් කුලියට වැඩ කළේ. අම්මා ගෙදර සිටියා. හැබැයි මේ දෙන්නම ගියේ එකම පාසලට. දෙන්නා එකම පන්තියේ. දෙන්නා හරිම යාළුයි. කෑම කෑවේ, පාඩම් කළේ සෙල්ලම් කළේ එකටමයි.

මේ දෙන්නා සවසට සෙල්ලම් කරන්න ගියේ වෙල් යායට එහා තිබෙන පිට්ටනියට. දවසක් විනිවිද ගියා පිට්ටනියට. නිමල් එතන නෑ. හැමතැනම බැලුවා. ඊට පස්සේ එයා දැක්කා නිමල් වෙල් යාය ළඟ බිම වාඩිවෙලා ඉන්නවා. විනිවිද ගියා එයා ළඟට "ඇයි මාත් එක්ක සෙල්ලමට ආවේ නැත්තේ?" ඔයාට අසනීප ද? විනිවිද ඇසුවා. නෑ නිමල් කිව්වා. නිමල්ගේ ඇස්වල කඳුළු . "එහෙනම් ඇයි ?" විනිවිද ඇසුවා. "තාත්තා ලෙඩවෙලා දැන් සති දෙකක් විතර වෙනවා. තව මාසෙකටවත් ඇඳෙන් නැගිටින්න බැරිවෙයි. දැන් නත්තලත් ළඟයි. වෙනදාට නම් අපි දුප්පත් වුනත් නත්තලට කෑම හදනවා. තාත්තා අපිට අලුත් ඇඳුම් ගේනවා. මේ පාර අපිට මුකුත් නෑ " නිමල් කිවුවා. විනිවිද ගෙදර ගියේ හරි හිතේ අමාරුවෙන්.

එදා රෑ කෑම මේසේ දී විනිවිද නිමල් ගැන හැමදේම ගෙදර අයට කිවුවා. "තාත්තා මට ගෙනා අලුත් ඇඳුම් දෙකෙන් එකක් මම නිමල්ට දෙනවා" විනිවිද කිව්වා. "තාත්තා මට සෙල්ලම් බඩු දෙක්ක ගෙනාවනේ මම එයින් එකක් නිමල් අයියාට දෙනවා." නංගිත් කිවුවා. "අපි ඒ ගොල්ලන්ටත් නත්තලට හදන කෑම බීමත් දෙමු" අම්මා කිවුවා. නත්තල්දාට ඉස්සරින් දා මම නිමල්ට අලුත් ඇඳුම් දීලා එනවා. දිව්‍ය පූජාවට ඇඳගෙන යන්න නත්තල් දවසේ අපි හැමෝම ඒ ගෙදරට යමු." විනිවිද කිව්වේ හරි සතුටින්.

නත්තල් දා උදයේ විනිවිදගේ පවුලේ අය තෑගිත් අර ගෙන නිමල්ලාගේ ගෙදර ගියා. ඔවුන් සමග සතුටින් තේ බිව්වා. "අනේ අපි මේවාට කොහොම ස්තුති කරන්නද මන්දා ?" නිමල්ගේ අම්මා කිව්වා. ඇයගේ ඇස් දෙකේ සතුටු කඳුළු. "ඔයගොල්ලෝ අද දවල්ට කෑම උයන්න එපා. අපි දවල්ට කෑම ගේන්නම්." විනිවිදගේ අම්මා කිව්වේ එළියට බහින ගමන්.

නත්තල යනු බෙදා ගැනීමයි. පුංචි අපිත් මෙය සිතට ගනිමු. "ඔබ සැමට සුබ නත්තලක් වේවා". ඔබට ජේසු බිළිඳු පිහිටයි.

**සසිරු විශ්මික පෙරේරා**
**ක්‍රිස්තු රාජ විදුහල - පන්නිපිටිය.**

# නත්තල

නත්තල යනු ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිහි කරනු ලබන, කතෝලික ජනතාව විසින් අති උත්කර්ෂවත් ලෙස පවත්වනු ලබන මංගල්‍යයකි. නමුත් කතෝලික ජනතාවට අමතරව කතෝලික නොවන ජනතාවක් ද නත්තල සමරයි.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මෙලොව ඉපදුනේ දුගී, අසරණ ජනතාව හා පවුකාර අප උදෙසායි. උන්වහන්සේ මෙලොව ජීවිතය ගත කළෙත්, කුරුස ගසේදී සිය දිවි පුද කළෙත් පවුකාරයන් මුදා ගනු පිණිසත්, පීඩිතයන් ගලවනු පිණිසත් ම ය.

වර්තමානයේ දී නත්තල කියූ සැනින් අපට මතක් වන්නේ අලුත් ඇඳුම් පැළඳුම්, ආහාර පාන හා ප්‍රිය සම්භාෂන ගැන පමණක් ද ? මෙසේ කිරීම නිවැරදී ද ?

ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනය බලාපොරොත්තු වෙන කතෝලික ජනතාව නත්තල් සමරන්නේ නම්, අපි කෙසේ නත්තල් සැමරිය යුතුද යන්න පිළිබඳ අප සිත් තුළින්ම විමසා බැලීය යුතුයි.

ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිහි කරන නත්තල් මංගල්‍යයේ දී උන්වහන්සේ අනුගාමී වන ජනතාවක් බවට අප පත්විය යුත්තේ හුදෙක් අප තුළ බාහිර අටෝපය ගැන ඇති වන සැලකිල්ල යටපත් කර ගනිමිනුයි. ජේසුස් වහන්සේ මෙන් සමාජයේ අසරණයන් උදෙසා අපි පිහිට විය යුතුයි.

එසේ නොවුනහොත් සිදු වන්නේ ක්‍රිස්තුන් වහන්සේගෙන් තොරව නත්තල සැමරීමකි.

**නිරන්දි කුරේ**
**සිරිකුරුස විදුහල**
**ගම්පහ.**

# නත්තල සමරන ඔබට පුංචි සිතිවිල්ලක් ...

තවත් එක් අඳුරු රැයක සීතල සමගින් ගත නැහැවෙද්දී පිණි පොද මෙන් වැටෙන සුදෝ සුදු හිම කැට සීරුවෙන් පොළව සිප ගනිද්දී රැයේ තිබු නිහැඩියාව, බැටළුවකුගේ කුර හඬකින් බිඳී යද්දී සීතල අතරින් කුඩා කිරිකැටියකුගේ ඉකි ගසමින් අඬන සිත් උණු වන ශබ්දය බෙත්ලෙහෙමේ ශුද්ධවූ නගරය පුරා පැතිර ගියේය.



බෙත්ලෙහෙමේ සිව්පාවුන් ලැගුම්ගත් ගවලෙනක බිළිඳෙකු බිහිවිය. මේ කිරිකැටියා සීතලේ ගැහෙමින්, නොවිඳිනා දුක් විඳිමින් තම උපන් ස්ථානය කුඩා ගවලෙනක් කර ගනිමින් දිළිඳු බවින්, ඉකි ගසමින් මුළු නගරයම ඇඬියාවේ පිරවීය.

මේ ඇඬියාව නිසා දිළිඳු ගොපළුන් ගවලෙන වෙතට පිය නගමින් දිළිඳු බවින් උපත ලැබූ කිරි කැටියාව දැක බලා ගැනීමට ඇති හැගුම්බර ආශාව සඵලමත් කරවීය. ලෝකයේ පාප දෝෂ සුණු විසුණු කර දමමින් උපත ලැබූ සාමයේ කුමාරයාණන්, ආදරය, ප්‍රේමය රැගෙන මෙලොවට ජනිත විය. නිරිඳුන් තිදෙනකු දුර බැහැර සිට බිළිඳුන්ට පිදීමට පඬුරු රැගෙන දේව අනුභාවය ඇතිව බෙත්ලෙහෙමට කැඳවා ගත් සේක. මෙලෙස අප අතරට මෙසියස් වහන්සේ ජනිත වීම ඈත අතීතයේ දී සැබෑ ලෙස සිදුවීය.

නමුත් මඳක් සිතන්න. සිත් අමනාපකම් වෛරය, ඊර්ෂ්‍යාව, කොන්කිරීම සමාජයේ පන්ති භේද අද කොතෙක් වේ ද ? මෙලෙස නත්තල් සැමරීම ඵල රහිතය.

එක මවකගේ සහෝදර සහෝදරියන් ලෙස ගවලෙන නම් වූ අපගේ හදවත් තුළ දිළිඳු බවින් ජය දද ඔසවන්නට, ජේසු බිළිඳු ගෙන ආ සාමය ලොව පුරා පතුරවන්නට, දිළිඳු බවින් ජේසු පිදීමට බෙත්ලෙහෙමේ ගවහලක් වීමට අපි උත්සාහ දරමු.

මේ සියළු දේවල් අතහැර දමා, ලොවේ ඇති අඳුර ඉරා, එක මවකගේ සහෝදර සහෝදරියන් ලෙස ගවලෙන නම් වූ අපගේ හදවත් තුළ දිළිඳු බවින් ජය දද ඔසවන්නට, ජේසු බිළිඳු ගෙන ආ සාමය ලොව පුරා පතුරවන්නට, දිළිඳු බවින් ජේසු පිදීමට බෙත්ලෙහෙමේ ගවහලක් වීමට අපි උත්සාහ දරමු.

**ඇන්ටන් අෂාන් සචිත්,**
**10 ශ්‍රේණිය,සා. ඇලෝසියස් කනිටු දෙව්සත්හල - බොරැල්ල.**

## නත්තලේ අරුත

රැක් අත්තන මල් පිපිලා සුවඳ හමනවා
සිහිල් සුළං රැළි ඇවිදින් ගත දැවටෙනවා
පුංචි අපේ මුවඟ සිනා නිති පැතිරෙනවා
සාම කුමරු නත්තල් දින උපත ලබනවා

පාපී සිතිවිලි අප සිත් තුල දුරුකර දමා
ජේසු කෙරෙහි අප සිත් නිරතුරුව නමා
දුගීන් දුප්පතුන් වෙත අප කළොත් පෙමා
සැබෑ නත්තලම වන්නේ එයම තමා

ජේසු උපත ලද දවසේ සතුටු වෙමු
අන් අය කෙරෙහි නිරතුරු සාමය පතමු
සාමෙ කුමරු හට අප දිවි කැප කරමු
මේ හැම දෙයින් නත්තලෙ අසිරිය විඳිමු

**ප්‍රවිඳු නවිෂ්ක,**
**ශ්‍රීපාලි විද්‍යාලය, හොරණ**

## මේ උදුවප් සීතල මාසේ

දෙව් කුමරුන් මෙලොවට වැඩියේ
මිනිස් වෙසින් මුළු ලොව නැහැවෙව්වේ
සාමයේ රස දසත පැතිරුවේ....
පාප අඳුර ලොව වෙසෙසා ගත්තේ
පහන් රුකක් මෙන් එළිය විහිදුවේ...
ජේසු පුතා ගවලෙනක ඉපදුනේ
ගව ඔරුවේ සැතපීලයි සිටියේ..
දේව ප්‍රේමයෙන් ජනයින් එක් කෙරුවේ
නව අරුතක් එක් කරමින් නත්තලේ...

**ඞ්. නිශාදි සදීනා ප්‍රනාන්දු**
**ස. සෙබස්තියන් දහම් පාසල**
**බරුදැල්පොල (තොඩුවාව මීසම )**




# නත්තල විසිතුරු

## ලෝකයේ විශාලතම ගවලෙන

වර්ෂ 1223 දී අසීසියේ සාන්ත ප්‍රැන්සිස් තුමා ක්‍රිස්තු උප්පත්තිය සංකේතවත් කරන්නට ඉතිහාසයේ මුල්වරට නත්තලට ගවහලක් නිර්මාණය කළේය. ඒ අනුව නත්තල් සමයේ ගවහල් නිර්මාණය නත්තල් චාරිත්‍ර වාරිත්‍ර අතර පෙරමුණට පැමිණ තිබේ. අප මෙවර විමසා බලන්නේ ලෝකයේ විශාලතම ගවලෙන ගැනය.

බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර මහ නගර සභා 19 න් එකක් කැකෙල්බර්ග් හි බැසිලිකා දෙව් මැදුරේ නම වතාවක් පැවැති නත්තල් ප්‍රදර්ශන වලදී සාම්ප්‍රදායික ගවලෙන් ප්‍රදර්ශනයක් ද පැවැත්විණි. පසුගිය වසර වලදී මෙන් නොව මේ වසරේදී බැසිලිකාවේ බිම් මහල මුළුමනින් ගවලෙන ඉදිකිරීමට තීරණය කර ඇති අතර එහි මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 2000 කට අධිකය. ඒ අනුව එහි ඉදිවන ගවලෙන ලෝකයේ විශාලම ගවලෙන බවට පත්වනු නියතය.

මෙහි ගවලෙන ඉදිකරද්දී ජෙරුසලෙම් තාප්ප, බෙත්ලෙහෙම් ගම්මානය, රජුන් තිදෙනා පැමිණි තවලම හා වෙළෙඳ පොල බැසිලිකාව තුළ ඉදිවන අතර ඒ මගින් එදා බෙත්ලෙහෙම් ගවමඩුවේ සැබෑ අනුරුවක් දැක ගැනීමට හැකිවේ.

මේ අභියෝගය සැබැවින්ම ආශ්චර්යවත්ය. ජෙරුසලෙම් මීටර් හයක් උස තාප්පයක් එදා පැවැති ඇඳුම් පැළඳුම් ස්ථාන ආදියත් උපයෝගි කරගනිමින් ජීවමාන ක්‍රිස්තු උපත නිරූපණය කරන්නට දරණ වෑයමක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය.

## ලෝකයේ උසම නත්තල් ගස සසුන් පියා ආලෝකවත් කරයි

ඉතාලියේ උම්බ්‍රියා ප්‍රදේශයේ ඉදි කරන ලද ලෝකයේ උසම නත්තල් ගස අතිඋත්තම සොලොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා වතිකානයේ සිය නිවහනේ සිට සෝනි ටැබ්ලට් කොම්පියුටරයක් උපයෝගි කරගෙන ආලෝකවත් කළේය.

ලෝකයේ විශාලතම නත්තල් ගස වන මෙහි විශාලත්වය අඩි 1, 476 x 2460 වන අතර එය වර්ග මීටර් 130, 000 ප්‍රදේශයක් වසා සිටින අතර පාපන්දු ක්‍රීඩාංගනයකට මඳක් කුඩාවේ. මෙය උම්බ්‍රියා ප්‍රදේශයේ ගුම්බියෝ නම් කඳුකර ප්‍රදේශයේ ඉග්ගිනෝ කඳුයාය ඉලක්ක කරගෙන ආලෝකවත් කර තිබේ. වර්ෂ 1981 සිට වාර්ෂිකව ස්වෙච්ඡා සේවකයන් විසින් මෙහි මේ නත්තල් ගස ඉදි කරනු ලැබේ.

වතිකාන ආරංචි මාර්ග වලට අනුව මේ නත්තල් ගසේ අත්තිවාරම මීටර් 450 පළල වන අතර මීටර් 750 ක් කඳුයාය දෙසට උසකින් පිහිටන්නේ සාන්ත උබල්ඩෝ බැසිලිකාව දෙස සිටය. විදුලි බුබුළු දස දහසකට අධික ප්‍රමාණයක් මේ නත්තල් ගස වර්ණවත් කිරීමට යොදාගෙන තිබේ.

## ලොව වඩාත් මිළ අධික නත්තල් සුබ පැතුම් පත



එක්සත් රාජධානි-යේ විල්ටෂයර් හි ඩෙවිසස් වෙන්දේසියකදී දැනට ලෝකයේ මිළ අධික නත්තල් සුබ පැතුම් පත ලෙස එංගලන්ත පවුම් 20, 000 කට (රු. 3900,000) අලෙවි වූ සුබපැතුම් පත

# කරන විශේෂ දෑ

කිරුළු පළඳා ඇත. වර්ෂ 1843 දී ශ්‍රීමත් හෙන්රි කෝල් විසින් සිය මිත්තණියට යවන ලද මේ සුබ පැතුම් පත නිර්මාණය කර ඇත්තේ ජෝන් කැල්කොට් හාස්ලි විසිනි.

## ලෝව විශාලතම නත්තල් සුරදූතයා

නත්තල් ගසේ ඉහළින්ම එල්ලන භාණ්ඩ අතර සුරදූතයාට ලැබෙන්නේ සුවිශේෂී තැනක්. දැනට ලෝකයේ විශාලතම නත්තල් සුරදූතයා අඩි 18 කට වඩා (මීටර් 5.57) උසින් යුතු අතර පාමුල පළල අඩි 8 කට වඩා වැඩිය. මෙහිදී වාර්තාව වී ඇත්තේ මේ සුරදූතයාගේ උස හෝ පළල නොවේ. මේ සුරදූතයා තැනීමට උපයෝගි කරගෙන ඇත්තේ බීර සහිත බෝතල් 2946 කි. මැක්සිකෝවේ නුච්චෝ ලියොන් හිදී 2000 දී මෙය ප්‍රදර්ශනය කළ අතර ගිනස් වාර්තා පොතටද එක්වී ඇත.

## ලොව විශාලතම නත්තල් රතිඤ්ඤාව

ලෝකයේ විශාලතම නත්තල් රතිඤ්ඤාව අඩි 181 අඟල් 11 (මීටර් 55.45) දිග අතර අඩි 11 අඟල් 9 (මීටර් 3.6) පළලින් යතුය. ඔස්ට්‍රේලියාවේ නිපද වු මෙය සිඩ්නි නුවර ප්‍රදර්ශනය කළ අතර ගිනස් වාර්තාවක් ලෙස ඇතුළත් වී ඇත.

## ලෝකයේ විශාලතම නත්තල් සීයා

නත්තලේ අරුමැසි විසිතුරු අංගයන් ගැන කතා කරන අතර ලෝකයේ විශාලතම නත්තල් සීයා සිටියේ කොහේදැයි ඔබ දන්නවාද ?

අඩි 51 ක් උස, ටොන් 2 1/2 බරැති මේ යෝධ නත්තල් සීයා ජීවමාන කෙනෙකු නම් නොවේ. සිංගප්පූරුවේ ටැංලින් සාප්පු සංකීර්ණයේ ඉදි කළ මේ නත්තල් සීයා 1996 නොවැම්බර් 10 වැනිදා ප්‍රදර්ශනය ඇරඹූ අතර 1997 ජනවාරි 7 වැනිදා දක්වා එය පැවැත්විණි. පොලිෆෝම් හා යකඩඩ යොදාගෙන තැනු මේ යෝධ නත්තල් සීයාද මේ වනවිට ගිනස් වාර්තා පොතේ පිටු අතරට එක්වි හමාරය.





## නත්තල් සීයලා දහතුන් දහසක් එක තැනකට රැස්වෙති

සාමාන්‍යයෙන් දුවා දරුවන් නත්තලේදී ආසාවෙන් බලා හිදින්නේ නත්තල් සීයා එනතුරු නේද ? දෙසැම්බර් 24 නත්තල් දිනයට පූර්ව රාත්‍රියේදී ගෙවී ගිය වසර හොඳින් සිටි දූ දරුවන්ට තෑගී ගෙනත් දීම නත්තල් සීයාගේ සිරිතයි.

ඒ කොයි හැටි වෙතත් අතුරු අයර්ලන්තයට ලොව පුරා සිටින වෘත්තීය නත්තල් සීයලා දහතුන් දහසක් එක් රොං-ක්වු බව ඔබ අසා තිබේ ද ? මේක ඇත්තක් - 2007 වසරේ දෙසැම්බර් 9 වැනිදා උතුරු අයර්ලන්තයේ ඩෙරි නම් නගරයේ පිහිටි ගිල්ඩ්හෝල් චතුරස්‍රයට මේ නත්තල සීයලා දහතුන් දහස ගිනස් වාර්තා පොතටත් දැන් ඇතුළත් වෙලා හමාරයි.

## නත්තල් සීයාට ලැබුණු වැඩිම ලියුම් ගණන

වසරක් ගෙවී යන නතත්ල් සමය උදාවන්නට පෙර කල්වේලා ඇතිව නත්තල් සීයාට ලියුම් යැවීම ලොව පුරා දක්නට ලැබෙන චාරිත්‍රයක්. කැනඩාවේ පමණක් නත්තල් සීයාට ලියු ලියුම් දසලක්ෂ 1.06 ක් සොයා ගැනීමට තැපැල් දෙපාර්තමේනතු සේවකයන් සමත්වී සිටින අතර නත්තල් සීයාට යැවු විද්‍යුත් ලිපි ඊමේල් 44, 166 ක් ද ලැබී ඇත.

මේ ලියුම් වලට භාෂා 11 කින් උත්තර ලියන්නට ස්වේච්ඡා සේවක සේවිකායන් 11, 000 ක් සේවයට යොදාව ගෙන සිටි අතර "බ්රේල්" ක්‍රමයට ආ ලියුම් වලට ඒ ක්‍රමයෙන්ම උත්තර සැපයීය. ඔබ සැමට සුබ නත්තලක් !

ශිරාන් මෛත්‍රී

# රණ ගී විරිත් ගෙන කැරොල් ගී උපන් හැටි

මිනිස් ඉතිහාසයේ ම්ලේච්ඡ පිටුවකට නෙත් හැරවී මට මෙහිදී අපට සිදුවේ. විසි හත්වන වියේ පසුවූ රජතුමකු ඔහුගේ සහෝදරයා විසින් සහසික ලෙස මරා දැමීමේ පුවතක් මෙයට පසුබිම් වේ. චෙකොස් ලොවෙකියාවේ වැන්සස් ලාවුස් රජතුමා ඔහුගේ සහෝදරයාගේ මාලිගය තුළදී මරා දමා දැනට වසර දෙදහසක් පමණ ගෙවී ඇත. එම රටේ ආරක්ෂිත ශාන්තුවරයා ලෙස නම් කෙරෙන එතුමාගේ මරණ සංවත්සරය එතුමාගේ ජම්මභූමිය වූ චෙකොස්ලොවෙකියාව පුරා අදත් සිදු කෙරෙයි. වැන්සස් ලාවුස් කුමරා මෙලොවට ජම්ම ලාභය ලැබුවේ ක්‍රි.ව. 909 දීය. මේ වනාහි මිථ්‍යා බලවේගයන් සමග ක්‍රිස්තු ලෝකය ප්‍රාණපරිත්‍යාගී සටනක - මිනිස් බිලි පූජාවන් සිදුවූන අඳුරු යුගයකි. මෙම කුමරාගේ පියා බොහෙමියාවේ පළමු වන ක්‍රිස්තියානි නායකයා වූ රට්ස්ලාවුස්ය. මෙම රජුගේ මහේෂිකාව වූයේ රූප රැජිනියක වූ ඩාහෝමරා නැමති මිථ්‍යා දෘෂටික කුමරියකි. මෙම මහේෂිකාව කිසි දිනක තම පුත් වැන්සස් ලාවුස්ට ප්‍රේම නොකළාය. ඇගේ ආදරය දිනා ගත්තේ බොලැෂ්ලාවු නමැති කාලවර්ණයෙන් යුත්, හැඩිදැඩි දාමරික ඇගේ බාල සහෝදරයාය.



මේ හේතුව නිසා වැන්සස් ලාවුස් කුමරා ඇතිදැඩි වූයේ තම මිත්තනියවූ ලුඩ්මිලා මැතිණියගේ සෙවන යටතේය. එතුමිය මෙම කුමරාට ශිල්ප ශාස්ත්‍රය පමණක් නොව ක්‍රිස්තු ධර්මය ද ඉගැන්වූවාය. එමෙන්ම බොහිමියාව පුරා පැතිර තිබුන වතුකරයේ ද දුගී ජීවිතයක් ගෙවූ ගම්වාසීනට උදව් කිරීමට ද ධෛර්ය කළාය.

දිනක් වැන්සස් ලාවුස් කුමරා විනාශ කිරීමේ අධිෂ්ඨානයෙන් යුතුව, එම රජුගේ (වැන්සස් ලාවුස්ගේ) සහෝදරයාවූ බොලෙස් ලාවුගේ මාලිගය ඉදිරියට පිරිසක් රොක් වුහ. බොලෙස් ලාවු වෙන්වූ රාජ්‍යයක අධිපතියා විය. ඔහුගේ රාජධානියේ සිටි සිය ගණන් ධන කුවේරයෝ එදා රැස්වූ සෙනග අතර සිටියහ. වැන්සස් ලාවුස් රජ මෙම කුමන්ත්‍රණය ගැන ඇසූ නමුත් ඒ ගැන විශ්වාස කිරීමට තරම් මැලි විය. මක්නිසාදයත් තම සොහොයුරා තමාට ලැදිව සිටි හෙයිනි. ඒ නිසාම සැකැක් නැතිව එයද පිළිගත්තේය. ක්‍රි.ව. 936 සැප්. 28 වෙනිදා උදේ අළුයම තම මාලිගය සමීපයේ පිහිටි දෙව්මැදුරට ඔහු පා තැබූ වේ දිව්‍ය පූජාවට සහභාගී වීම පිණිසය. මේ වෙලාවටම ඔහුගේ සහෝදර බොලෙස්ලාවු එම දෙව්මැදුරේ දොරටුව අසලට වී ඔහු එනතුරු රැක සිටියේය. රජතුමා සොහොයුරාට සුබ පැතීමට තම අත දිගු කළේ ය. එහෙත් සොහොයුරා එය ප්‍රතික්ෂේප කළේය.

“ මම දැන් ඔබට උණුසුම් ආචාරයක් පිළිගන්වමි. තවදුරවත් මට තුති නොපුදන්න.” මෙසේ කියමින්ම ඔහු තම අසිපත ගෙන වැන්සස් ලාවුස් රජු වෙතට වැරෙන් ගැසයී. අවි රහිතව සිටි රජතුමා තමාගේ බාහුවෙන් සතුරු සොහොයුරා මෙල්ල කළ නමුත්, අවාසනාවකට මෙන් කුමන්ත්‍රණකාරයන් තිදෙනෙක් වහා එතැනට ඇදී ආහ. රජතුමාට දෙව් මැදුරට ඇතුළු වීමටවත් ඉඩක් නොලැබුණි. සාහසිකයකුගේ කිනිස පහරකින් එතුමා බිම පතිත විය.

**තව ද කිසියම් දිනක එතුමා නත්තලට පෙර දින සවස් කාලයේ දී හිමෙන් වැසුන කැලයක දර රැස් කරමින් සිටි දුප්පත් වැසියකු දිටිය. රජතුමා අසුපිටන් බැස එම දර අසුපිට පටවා ඒ ගැමියාගේ ගෙදරට ගෙන ගොස් දී, ඔහුට රන්කාසි කිහිපයක් ද දී ආපසු ගියේය.**

**ක්‍රි.ව. 1870 දී එංගලන්තයේ ගැමි ජනයා මෙතුමා ගැන තනන ලද කැරොල් ගී ගැයීමට පටන් ගත්හ. මෙම කැරොල් ගී තනන ලද්දේ ඇන්ග්ලිකානු පූජකයකු වූ ජෝන් නීල් නමැත්තාය. ඔහු භාවිතා කරන ලද්දේ මධ්‍යතන යුගයේ රණ ගී වල විරිත්ය. කිතුනු ලොව පුරා අද සැමතැනම නත්තල් කැරොල් ගායනා කිරීමත්, ඉන් නත්තල් ප්‍රීතිය පළ කිරීමත් සුලබ දර්ශනයකි.**

වැන්සස් ලාවුස් රජතුමා නිල බලය, ධන බලය ගැන නොතකා යුක්තිය සාධාරණව ඉටු කළේය. එතුමාට විරුද්ධ බලවේග පැන නැගීමට මෙය ද හේතුවක් විය. රදළයන්ගේ අත්තනෝමතික ක්‍රියා අනුව, අවුරුදු ගණන් සිරව සිටි සිරකරුවෝ මෙතුමා අතින් නිදහස් වූව හ. එමෙන්ම රදළයන් අතින් අනතුරට භාජන වූ ස්ත්‍රීන්, අනාථයන් ඒ තත්තවයෙන් මුදාවා ගත් අතර, මංකොල්ලකරුවන් වැනි අයගේ ක්‍රියාවලට ඉඩ නොතැබිය. ජර්මනියෙන් හා ප්‍රංශයෙන් තාපස තාපසිකාවන් ගෙන්වා. සිය රටේ දරුවන්ටත් වැසියන්ටත් ශාස්ත්‍රය හැදරීමට මං පෑදීය. එතුමා සමහර

**කරුණාකර 15 පිටුව බලන්න**

# ආලෝකය වෙත ගමන් කරමු !



ජීවියෙකු ලෙස උපත ලද මිනිසා සතු අඳුරු මාවත් පසෙකලා ආලෝකය කරා යොමු වීමට, ගමන් කිරීමට මෙදා නත්තලේ ජේසු සමිඳුන් අපට ආරාධනා කරයි. සෑම සාර්ථකත්වයක් පසුපස ශක්තිමත් හස්තයක් ඇතුවා සේම ඝනඳුරක් පසුපස නොමියෙන ආලෝකයක් ද ඇත. බාහිර පෙනුමින් වෙනසක් ලබන අපට ඇතුලාන්ත සිත් හැරීමක් හා දුක් මනස්ථාපනයක් වීමට ආරාධනා කරන ජේසු සමිඳුන්ට අපගේ පිළිතුර විය යුත්තේ කුමක්ද ?

නත්තල උදාවීමත් පෙරටු කර ගනිමින් රතිඤ්ඤා හඬ දෙසත පැතිරීමත් සමග කිතු සමිඳුන්ගේ උපත සැමරීමට කිතුනු අප ළහි ළහියේ සූදානම් වෙමු. මේ සූදානම් වීම, අප සැමගේ ඇතුලාන්ත සිත් හැරීමක් ද යන්න අප මඳක් සිතිය යුතුය. අරුත්බර නත්තලක් සැමරීමට නම්, අපි මෙන් අසරණ දුප්පත් පාසල් දරුවන්, වීදි දරුවන් සමග මෙදා නත්තලේ අසිරියබෙදා ගත යුතුය. අප සිතින් වචනයෙන් සහ ක්‍රියාවෙන් කරන්නාවු පාපයන්ට ඉතා ඕනෑකමින් දෙවියන් වහන්සේගෙන් සමාව ඉල්ලා දුක් මනස්ථාප විය යුතුය. බාහිර ලෝකයේ සිතුවිලි වලට මුලා වී අඳුරු සෙවනැලි ඔස්සේ හඹා යන වත්මන් මිනිසුන්ට ආලෝකයේ මාවතට පිවිසීමට හොඳම කාලය මෙදා නත්තලයි. අඳුරේ සැරිසරන ඕනෑම අයෙකු තුළම යක්ෂයාගේ පරීක්ෂාවන් මෙන්ම භීතිය ද සැරිසරයි. එසේ අයකුට ඒ අඳුරු මාවතෙන් එහාට ගොස් ආලෝකය වෙතට ගමන් කිරීමට හැකි වන්නේ හදවතින්ම සැබෑ වෙනසක් ළඟා කර ගැනීම තුළයි. නත්තල උදා වීම තුළින් ජේසු සමිඳුන් අපට පවසන්නේ අවුරුද්දක් පුරාවට අප කළ සියළුම පාපයන් , කඩ කෙරූ දස පණත නැවත නිවැරදි කර ගැනීමටය. ඔබ හා මා සිතට ගත යුත්තේ ද එයයි. රාත්‍රී පූජාවට සහභාගි වී කිතු උපත සමරා යළි නිවෙස් කැටුව පැමිණෙන සැමදෙනාම එකමුතුව සිට ප්‍රීති ඝෝෂා පවත්වා උදම් අනන්නේ මරණය පරාජය කර උපත ලැබූ එකම රජාණන් සිහි කිරීමටයි. එසේ සතුටු වන අප ජේසු සමිඳු ආරාධනා කරන කැඳණවීම භාර ගැනීමටද සූදානම් විය යුතුය.

**නවංජනී තාරිකා ප්‍රනාන්දු**
**12 ශ්‍රේණිය,**
**දංකොටුව බාලිකා මහ විදුහල**

# ගැලවුම්කරුගේ උපත

පුංචි බෙත්ලෙහෙමේ
ගව ඔරුවෙ උණුසුම මැද
මාපිය සෙනෙහස සමඟින්
බිහිවුණි පුත් රුවනක්
මනුසත් ලොවට
පාප බරින් අප ගලවන්නට
නව ලොවකට
පියමං කරන්නට
මෙලොවට බිහිවුයේ
ඔබමයි කිතු තුමේ
අඳුර දුරුකර
ආලෝක කරමින්
පාප බැම්මෙන්
ලොව මුදමින්
උපත ලැබූ කිතු තුමේ
ඔබයි අපේ ගැලවුම්කරු



**වර්ජින් පෙරේරා, 12 ශ්‍රේණිය (වාණිජ)**
**සා. බ්‍රිජට් කන්‍යාරාමය - කොළඹ 07.**




**මෙවර කිතුනු ළමා හමුවේ රට රටවල නත්තල් සිරිත් පිළිබඳව විශේෂ වැඩසටහනක් විකාශනය වේ.**

**දෙසැම්බර් 18 වන ඉරුදින ප.ව. 5.30 ට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ විකාශනය වන මෙහි කරුණු ඉදිරිපත් කරන්නේ ඥානාර්ථප්‍රදීපය සහය සංස්කාරක ශිරාන් මෛත්‍රී මහතා විසිනි.**



**සුරංගි කෞශල්‍යා ප්‍රනාන්දු**
11 ශ්‍රේණිය,
සද්ධාසරණ දහම් පාසල
වීහේන - වැල්ලකැලේ



**හර්ෂ ප්‍රියංකර**
10 ශ්‍රේණිය,
සා. නිකුලා
දහම් පාසල
බෝපිටිය



**දේශානි අබේරත්න**
9 ශ්‍රේණිය,
ශ්‍රී හෘදයේ දේවස්ථානය
කටුගස්තොට

පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව" ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය, කොළඹ 08.



**විහංගි මධුකලා නවමාලි**
4 ශ්‍රේණිය,
සීවලි නවෝද්‍යා මහා විද්‍යාලය
බණ්ඩාරවෙල



**අශේන් මධුෂ ප්‍රනාන්දු**
1 ශ්‍රේණිය,
සා.මරියා දහම් පාසල - පුත්තලම



**තරුෂි කාව්‍යා ප්‍රනාන්දු**
7 ශ්‍රේණිය,
සා.මරියා දේවස්ථානය,
කටුකුරුන්ද, මොරටුව



**කේ.පී. හෂිනිකා කෞශල්‍යා වික්‍රමසිංහ**
3 ශ්‍රේණිය,
සා. ඇලෝසියස් දහම් පාසල
රඹුක්කන



**ඔනෙත් දම්රු**
1 ශ්‍රේණිය,
සා. පීතර විදුහල - (ගම්පහ ශාඛාව)



**සුසාර ප්‍රනාන්දු**
3 ශ්‍රේණිය,
සා. ජෝශප් විදුහල, (මීගමුව ශාඛාව)



**රඥුන් උදයන්ත ප්‍රනාන්දු**
සා. තෙරේසා දහම් පාසල
තල්විල



**කීත් ජොහේන් කොලස්**
ශු. පේදුරු පාවුළු දහම් පාසල
රාගම



**සහන් මධුෂ ප්‍රනාන්දු**
සා. මරියා දහම් පාසල
පුත්තලම

ආදර දුවේ පුතේ, ළමා ප්‍රදීපය නත්තල් කලාපයේ පිටකවරය සිතුවම් කිරීමට අප කළ ආරාධනයට ඔබ දැක්වූයේ ඉහළ ප්‍රතිචාරයක් හා උනන්දුවකි. අප වෙත ලැබුණු විශාල වූ චිත්‍ර ප්‍රමාණයෙන් උසස් මට්ටමේ පැවැති චිත්‍ර කිහිපයක් මෙසේ පළ කිරීමට අපි සිතුවා. ඒ ඔබ සතු කුසලතාවයන්ට දිරි දීමක් වශයෙනි. ආදර දුවේ පුතේ දිගටම ඔබ ළමා ප්‍රදීපය සමඟ අත්වැල් බැඳගන්න. ඔබගේ කුසලතාවයන් එළි දැක්වීමට අපි කැපවී සිටිමු.

සංස්කාරක පියතුමා.



**නිපුනි නවෝදා පෙරේරා**
ශු. ජුසේ මුනිඳුන්ගේ දහම් පාසල
ග්‍රෑන්ඩ්පාස්



**එම්. උදේෂි ප්‍රසංගිකා සල්ගාදු**
වික්ෂෝප දේව මාතා දහම් පාසල
වලාන ( පානදුර මීසම)



**සචින්ද ශ්‍යාමල් කරුණාතිලක**
නිර්මල ලූර්දු දේවමාතා දහම් පාසල
කිඹුලාපිටිය

**මාසික සිතිවිල්ල**



මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

මාසික සිතිවිල්ල, “දෙසැම්බර් මාසය”
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

**4 පිටුවේ ඉතිරිය**

එක්කම අපේ ගෙවල් පැත්තේ එන්නකෝ..රෑට මොනවා හරි කාලා යන්නත් එක්ක.... කොහොම වෙතත් ළමයව දිගටම ප්‍රැක්ටිස් යවන්න... නත්තලටත් තව වැඩි දවසක් නෑනේ. එහෙනම් අපි ගිහින් එන්න්ම්..."

ඔවුන්ගේ සමුගෙන සුපුන් හා මව පිටවූහ.

"පව් නේද අම්මා ? සමන්මලීගේ ඇඳුමට අපි සල්ලි දෙමුකෝ. එතකොට එයා, කැරොල් එකට එයි... එයාලව අපේ ගෙදර නවත්තගන්න බැරිද අම්මා ? ඒ ෂෙඩ් එක තෙමෙනව වගේ. රෑට ගොඩාක් සීතල ඇති එයාලට ජනෙල්වත් නැහැනේ" සුපුන් යන ගමන් තම මවට කිවුවා. "අපි බලමුකෝ පුතා හවසට ඒයාලා ආවොත් !"

..............................

පල්ලියේ තිරින්දාදි ගසන හඬින් පාන්දර 5.30 වී ඇති බව සුපුන්ට දැනුනා. පාසල් නිවාඩු කාලය නිසා, පාන්දර අවදිවීමට නිශ්චිත වේලාවක් නැතත්, සීතල උඳුවප් මාසයේ, පරිසරයේ ඇති සිසිලසට සුපුන් ආශා කළ නිසාම, අවදිවී, වත්තේ, මිදුලේ එහා මෙහා ඇවිදීමට ඔහු පුරුදුව සිටියා. මිදුලට ගිය ඔහුට දැක ගන්නට ලැබුනේ සිය මව, පියා සහ සිරිසේන මාමා නිවසට යාබදව ඇති ඇනෙක්සියේ යම් කටයුත්තක යෙදී සිටින බවයි.

"ආ ! පුතා... මේ වැඩ ටික ඉවරවෙලා අපි සමන්මලීගේ පවුලට මේක දෙනවා ! හොඳයි නේද ?" අම්මා පැවසුවා.

"ඊයේ ඒගොල්ලෝ ආව ද ?" සුපුන් ඇසුවා.

"ඔව් එවෙලේ පුතා නිදි. අපි අද ප්‍රැක්ටිස් යනකොට සමන්මලීවත් අරගෙන යමු. එයා කැරොල් ඒකට ඉන්නවා... පුතාගේ ඉල්ලීම් සේරම ඔන්න තාත්තා ඉෂ්ඨ කරනවා."

"හරි හොඳයි.. මට මෙදා සැරේ නත්තලට වෙන මුකුත් විශේෂ තෑගි එපා අම්මා. සමන්මලීගේ පවුලට කරන මේ උදව් තමා මට දෙන තෑග්ග".

දින සති ගෙවී ගියා. සමන්මලී සහ පවුල සුපුන්ගේ නිවසේ යාබද කොටසේ පදිංචි වුණා. සියලු දුසිරිත් අත් හරින බවට පොරොන්දු කරවා ගෙන, සමන්මලීගේ පියාට, තම ඉඩමේ නඩත්තු කටයුතු සමඟින් වගාවක්ද කරගෙන, යහපත් ජීවිතයක් ගත කිරීමට සුපුන්ගේ පියා ඉඩ කටයුතු සලසා දුන්නා. හොඳ මිතුරියක් ළඟම සිටින නිසා සුපුන්ට ද පාළුවක් දැනුනේ නෑ. ඔවුන් දෙදෙනාම එකතුවී නිවෙස් දෙකට මැදි වනසේ අලංකාර නත්තල් ගසකුත්, ගවලෙනකුත් හැදුවා. නත්තලට දින දෙකකට පෙර දහම් පාසල් නත්තල් උත්සව දිනයේ දී පියතුමාගෙන් අනෙකුත් අය මෙන්ම. සමන්මලීගේ මවත්, විශේෂයෙන්ම සුපුන්ගේ පියාගේ අවවාද පිළිගෙන සැබෑ සිත්හැරීමකට ලක්වූ ඇගේ පියාත්, සමඟිවීමේ ප්‍රසාද නිධානය ලබා ගත්තා. එදිනම රාත්‍රියේ සමන්මලිගේ මව රෝහල් ගත කළ අතර, සමන්මලීට මල්ලී කෙනෙකු දැන් සිටිනා පුවතද රැගෙන ආ, සුපුන්ගේ මව සතුටින් ඇයව වැළඳගත්තාය. නත්තල් මධ්‍යම රාත්‍රී දිව්‍ය පූජාවට සුපුන්ගේ පවුලෙන් ත්‍යාග ලෙස ලද අළුත් ඇඳුම්ද හැඳ සමන්මලි හා පියා ඉතා සතුටින් සහභාගීවුණා. පසුදින, එනම් නත්තල දිනයේ සුපුන් හා සමන්මලී මඟ බලා සිටි චූටි මල්ලියා නිවසට රැගෙනාවා. ගවලෙනේ සිටින ජේසු බබාත් සහ චූටි මල්ලියාත්, මරියතුමිය හා සමන්මලීගේ මවත් අතර කිසිම වෙනසක් නැතැයි එදෙස බැලූ සුපුන්ට සිතුනා. රසවත් දිවා ආහාරයක් පවුල් දෙකම එකතුව භුක්ති විඳීමෙන් අනතුරුව, සවස් වරුවේ ඔවුන් අලුත් උපන් දරුවා ද සමඟ දේවස්ථානයට ගොස් යාච්ඤා කළා. සමන්මලීගේත්, ඇගේ මව්පියන්ගේත් හදවත් තුලින් දෝරේ ගලන සතුට සැනසුම මෙන්ම වෙනත් නත්තලක නොවිඳි තරමේ සතුටක් සුපුන්ගේ පවුලත් මෙවර අත්වින්දා.

"මගෙ නත්තල දූගියා බත් කන දා ය"

මගෙ නත්තල පව පල්ලිය යන දා ය"

මර්සලින් ජයකොඩි පියතුමාගේ මේ සංකල්පනාව සුපුන්ගේ මතකයට නිතැතින්ම ගලා ආවා.

**ළමා ප්‍රදීපය පිට කවරය සිතුවම් කළ සිත්තරාවිය...**

ළමා ප්‍රදීපය 2011 නත්තල් කලාපයේ පිටකවර සිතුවම සඳහා අපට ලැබුණු චිත්‍ර අතරින් ජයග්‍රාහී නිර්මාණය යොමු කරනු ලැබුයේ එම්. දිලිනි ඉෂාරා පෙරේරා සිසුවියයි. ඇය 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර 2011 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුවියකි.

ඇය වැලිවේරිය සාන්ත අන්තෝනි දහම් පාසලේ ඉගෙනුම ලබන්නීය. මෙවර ළමා ප්‍රදීපය නත්තල් කලාපය අලංකාර පිට කවරයකින් සිතුවම් කරන ලද දිලිනි ඉෂාරා පෙරේරා සිසුවියට ළමා ප්‍රදීපය සුබ පැතුම් !

**ලබන සතියේ ළමා ප්‍රදීපය පළ නොවේ.**

නත්තල් හා අවුරුදු නිවාඩුව නිමිත්තෙන් කොළඹ කතෝලික මුද්‍රණාලය ඉදිරි සතියේ වසා තැබෙන බැවින් (2011.12.26 වන දින )ළමා ප්‍රදීපය පළ නොකෙරෙන බැව් කරුණාවෙන් සලකන්න. නැවතත් සුපුරුදු පරිදි 2012 ජනවාරි 02 වන සඳුදා සිට පළ කෙරේ.

සංස්කාරක පියතුමා

### 5 පිටුවේ ඉතිරිය

ආදර දුවේ පුතේ මේ තාත්තා හොරෙක් වුනේ කවුරු නිසාද ? දරුවෝ නිසා. දරුවන්ට තියෙන ආදරේ නිසා. දෙමාපියෝ දරුවන් වෙනුවෙන් ඕන දෙයක් ඕන, කැපවීමක් කරන්න ලැස්තියි. දෙමාපියෝ දරුවෝ නිසා ඒක වැරැද්දක් කියලා හිතන්නේ නෑ. හිතන්න පොඩ්ඩක්, සමහර විට ඔබ නිසාත් ඔබේ තාත්තාට අම්මාට මෙවැනි දේකට ඉදිරියේ මුණ දෙන්න වේවි. ඒ නිසා නැති දේවල් ඉල්ලලා කරදර කරන්න එපා. ! එපා. !! එපා. !!!

මෙදා පාර ඔබ ගවලෙන ළඟට ගිහිල්ලා ජේසු බබාට කියන්නේ මොනවා ද ? ඉල්ලන්නේ මොනවා ද ? ගවලෙන ළඟට ගියාම බලන්න සිනාමුසු මුහුණින් ඉන්න ජේසු පුතා දිහා. අද අපට තියෙන කිසිම පහසුකමක් ජේසු බබාට තිබුණේ නෑ. ඒත් මුළු ලොක්යට ලැබුනු වගේ සතුටින් මරිය අම්මාගේ උණුසුමත් ජුසේ තාත්තාගේ රැකවරණයත් තියෙද්දී තව මොනවා ද ? අඩු දුවේ පුතේ අම්මාගේ තාත්තගේ ආදරයට එහා යන තවත් කිසිවක් මේ ලෝකේ නැහැ. එයින් සෑහීමකට පත් වෙන්න. වෙන ආදරයත්, රැකවරණයත් සොයා යන්න එපා. විශේෂයෙන් අසම්මත ප්‍රේම සම්බන්ධතා අපේ රටේ ද ඇති මුත් බොහෝ විට අවසන් වන්නේ මරණයකිනි. වයසට අනුව හැදෙන්න. ජේසුගේ ජීවිතය දෙමාපියන්ගේ ප්‍රේමය රැකවරණය ලස්සන කළා. වෙන්න ඔබත් ජේසු වගේ හොඳ දරුවෙක්ම. මෙදා ගවලෙන ළඟට ගිහිල්ලා ඔබේ එක අඩුපාඩුවක් ජේසු බබාට දෙන්න. එයින් මිදිලා හොඳ දරුවෙක් වෙන්න උත්සාහ කරන්න. ඔබට වාසනාවන්ත සුබ නත්තලක් වේවා !

### 10 පිටුවේ ඉතිරිය

අවස්ථාවල දී ලිපිකරුවකු ලෙස වෙස් වලාගෙන ඇවිදිමින් රටේ තොරතුරු සෙවීය. වරදකරුවන්ට ඒ ඒ ස්ථාන වල දීම දඬුවම් දුනි.

තව ද කිසියම් දිනක එතුමා නත්තලට පෙර දින සවස් කාලයේදී හිමෙන් වැසුන කැලයක දර රැස් කරමින් සිටි දුප්පත් වැසියකු දිටිය. රජතුමා අසුපිටින් බැස එම දර අසුපිට පටවා ඒ ගැමියාගේ ගෙදරට ගෙන ගොස් දී, ඔහුට රන්කාසි කිහිපයක්ද දී ආපසු ගියේය.

ක්‍රි.ව. 1870 දී එංගලන්තයේ ගැමි ජනයා මෙතුමා ගැන තනන ලද කැරොල් ගී ගැයිමට පටන් ගත්හ. මෙම කැරොල් ගී තනන ලද්දේ ඇන්ග්ලිකානු පූජකයකු වූ ජෝන් නීල් නමැත්තාය. ඔහු භාවිතා කරන ලද්දේ මධ්‍යතන යුගයේ රණ ගී වල විරිත්ය. කිතුනු ලොව පුරා අද සැමතැනම නත්තල් කැරොල් ගායනා කිරිමත්, ඉන් නත්තල් ප්‍රීතිය පළ කිරීමත් සුලබ දර්ශනයකි.

## ප්‍රහේලිකා අංක 27



**හරහට**

1. සැම දේටම වඩා වැදගත් වන්නේ ප්‍රේමය බව ශු. පාවුළුතුමා මොවුන්ට යවන ලද පළමු ලිපියෙහි සඳහන් වේ.
4. ශු. ලියවිල්ලේ සළමොන්ගේ ප්‍රඥාව පොතේ පවසන්නේ, ප්‍රඥාව මෙයට වඩා අගනා බවයි.
5. ක්‍රිස්තුන් වහන්සේ මෙය මතදී අප වෙනුවෙන් දිවිපිදු සේක.
7. ............ ක් නැති ඉඩම කොල්ලකනු ලබන්නේයැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. ස්නාවක ජුවාම් තුමාගේ පියා

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව ප්‍රදර්ශන දොරටුව අසල සිටි මෙවැන්නෙකු පේදුරු තුමා සුව කළේය.
2. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වන විට දේව මාළිගාවේ මෙය දෙකඩව ඉරීගිය බව ශු. ලියවිල්ලේ සඳහන් වෙයි.
3. රන්කාසි දසය පිළිබඳ උපමාවේ, ස්වාමියා රාජ පදවියක් ලබන පිණිස මෙහි ගිය බව පැවසේ.
6. තම අසල්වැසියා හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙම ජාතිකයාගේ උපමාව වදාළ සේක.
8. එළියා දිවැසිවරයා එම රටේ වූ තුන් අවුරුදු නියගය නිම කරමින්, දෙවියන් වහන්සේ සැබෑවූ එකම දෙවියන් වහන්සේ බව මිනිසුන්ට පෙන්වමින් මෙය ලබා දුන්නේය.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් පරිච්ඡේදය ආධාර කරගත හැකිය. ශු. ලුක් 10,19, 23 පරිච්ඡේද, ක්‍රියා 3, ශු. මතෙව් 5, 1 රාජාවලිය 17, සළමොන්ගේ ප්‍රඥාව 7, උපදේශකයා හෙවත් සිරාක් 36, 1 කොරින්ති 13)

**නිවැරදිව ප්‍රහේලිකාව පුරවා තැපැල් පත් මඟින් පමණක්, ප්‍රහේලිකා අංක 26, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )





කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හී, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා